ලියන ලද්දේ Museum Department
2016 දෙසැම්බර් 29 වෙනි බ්‍රහස්පතින්දා, 06:40 - අවසන් යාවත්කාලීන කිරීම 2017 ජනවාරි 03 වෙනි අඟහරුවාදා, 09:50

ඉපැරණි පුරාවිද්‍යා ස්මාරකයක් වන කොළඹ ජාතික කෞතුකාගාර..........................



ඉපැරණි පුරාවිද්‍යා ස්මාරකයක් වන කොළඹ ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ල රුපියල් මිලියන 225 ක වියදමින් ඉතාමත් සාර්ථකව සංරක්ෂණය කර ඇත. 1874 දී ඉදිකිරීම් ආරම්භ කරන ලද මෙම ගොඩනැගිල්ල 1877 ජනවාරි 01 දින මහජනයා සඳහා විවෘත කරන ලද අතර එදා මෙදාතුර මෙම ගොඩනැගිල්ලේ සිදු කරන ලද විශාලතම සංරක්ෂණ අලුත්වැඩියාව මෙයයි. මෙම සංරක්ෂණ අලුත්වැඩියා කටයුතු ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) උපදේශකත්වයෙන්, ශ්‍රී ලංකා යුධ හමුදා 6 වන ඉංජිනේරු සේවා බලකාය විසින් සිදු කරන ලදී.

මෙම සංරක්ෂණයේදී ගොඩනැගිල්ලේ බිත්තිවල තිබූ බදාම ගලවා අලුතින් බදාම යෙදීම, වහලය අලුත්වැඩියා කිරීම හා ඉහළ මහලයට සම්බන්ධ දැව බාල්ක ඉවත් කර ඒ සඳහා වානේ තලාන්ද යෙදීම වැනි අති විශාල සංරක්ෂණමය කාර්යයන් සිදුකරන ලදී.

කොළඹ ජාතික කෞතුකාගාරයේ මෙකී සංරක්ෂණ කටයුතු සාර්ථකව නිමකිරීම සහ කෞතුකාගාරයට වසර 140 ක් පිරීම නිමිත්තෙන් මේ මස 29 වන දින සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයක් සහ පසු දින උදෑසන සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කටයුතු සූදානම් කර ඇත.

{besps}/News/2016/December{/besps}